සේරුවිල ප්‍රාදේශීය සභාව

-----------------------------

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

-----------------------------

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 17 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ඔක්තෝම්බර් 29 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දින සේරුවිල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ වශයෙන් ලැබිය යුතු රු. 1,420,450 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

-----------------------------------------

රු. 9,124,422 වූ ගෙවිය යුතු ගිණුම්වලට අදාල ශේෂ සනාථ ලිපි , කාලවිශ්ලේෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්.

------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති,රෙගුලාසි සහ විධිවිධානවලට අනුකූල නොවීම් විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශිය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය | සභාබල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) පළාත් පාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතු වුවද, සභාව සතු වාහන 16 සම්න්ධයෙන් එසේ කර නොතිබුණි. |
| (ඇ) පළාත් මූල්‍ය රීති අංක 237 | නිකුත් කල මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා |

ඉදිරිපත් නොවූ රු. 45,926 ක් වටිනා චෙක්පත් 27 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 571

2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අයත් ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු. 171,581 ක ශේෂයක් නිරවුල් කිරීමට හෝ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,516,011ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,081,004 ක් විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව වරෙන්තු ගාස්තු හා දඩ ලැබීම් රු. 7,374,630 කින් අඩු වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 5,564,993 කින් අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 **ආදායම් පරිපාලනය**

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

(අ) සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැමබ්ර 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 25 | - | 25 |
| බදු කුලී | 2,399 | 3,788 | - |
| බලපතු ගාස්තු | 428 | 552 | - |
| වෙනත් ආදායම් | 17,251 | 12,451 | 4,800 |

#### 2.2.2 කඩ කාමර කුලී

වර්ෂ 02 සිට වර්ෂ 04 දක්වා වූ කාල පරිච්ඡේදයකට අයත් එකතුව රු. 146,478 ක් වූ ලැබිය යුතු කඩ කාමර කුලී අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය

(අ) ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සංඛ්‍යා ලේඛණ අනුව 2013 වර්ෂයේ රෝගීන් 1,711 ක් සඳහා ද, 2014 වර්ෂයේ මුල් මාස 05 තුල රෝගීන් 1,186 ක් සඳහා ද, ඖෂධ නිකුත් කර තිබුණි. ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීම් කලද ආයුර්වේද වෛද්‍යවරයකු ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් පත් නොකිරීම නිසා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය 2014 ජුනි මස සිට වසා දමා තිබුණි. මේ හේතුවෙන් සභා බල ප්‍රදේශයට අයත් 14,741 ක් වූ ජනතාවට සේවය සපයා ඔවුන්ගේ සෞඛ්‍ය මට්ටම් නංවාලීමේ ප්‍රාදේශීය සභාවේ අරමුණු ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2015 අප්‍රේල් 21 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව නිර්දේශිත ක්‍රියාමාර්ග සම්න්ධයෙන් අවශ්‍ය කටයුතු විගණිත දිනය වූ 2015 ජූලි 17 දින වන විටද ගෙන නොතිබුණි.

(ආ) ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමකින් තොරව රු. 111,501,038 ක ගොඩනැගිලි ඉදිකර ඇතත්, එම ඉදිකිරීම්වල වටිනාකම අවසන් මූල්‍ය ප්‍රකාශන තුල ඉඩම් හා ගොඩනැගිලි ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, සභාව විසින් මෙම ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

3.3.1 ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ල ඉදිකිරීම

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලය සඳහා දෙමහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට රු. 27,709,341 ( එකතු කළ අගය මත බදු රහිත) වටිනාකමට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ගොඩනැගිල්ලේ රැස්වීම් ශාලාවේ ඇති ෆයිබර් (Fiber) සිවිලිමට මෙන්ම ලී වලින් තනා ඇති සිවිලිමට වහලයෙන් ජලය කාන්දු වී සිවිලිම දිරා යාමට ලක් වී තිබුණි. සිවිලිමේ ස්ථාන 4 කින් ජලය විශාල වශයෙන් කාන්දු වන බව 2015 ජුලි 15 දින කරන ලද විගණන ක්ෂේත්‍ර පරික්ෂාවේදී නිරික්ෂණය වූ අතර එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගොඩනැඟිල්ලේ ඉංජිනේරු ඇස්තමේන්තුවල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සභාවේ දොරවල් සහ ජනේල ඉදිකර නොමැති බව නියැදි විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර, ඒවා ඇස්තමේන්තු පිරිවිතරයන්ට අනුව ඉදිකර ඇති බවට සහතික කරමින් රු. 1,842,680 ක් ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රමාණ පත්‍රය අනුව අයිතමයේ අංකය | ඉංජිනේරු පිරිවිතරයන්ට කලයුතු කාර්යය | නිම කරන ලද කාර්යය | ගෙවන ලද මුදල |
|---|---|---|---|
| | | | රු. |
| M.2 | Aluminum & glazed door with fanlight (D1) with sum thick glass. | Aluminum & glazed door with lazed fixed windows. | 50,490 |
| M.8-M.11 | Aluminum & glazed windows with fanlight with sum thick glass. | Aluminum & glazed windows with lazed fixed windows. | 1,349,000 |
| M.13-M.14 | Aluminum & glazed with fanlight with sum thick glass. | Aluminum & glazed windows with lazed fixed windows. | 443,190 |

(ඇ) ගොඩනැඟිල්ලෙහි ඉදිකර තිබූ වීදුරු ජනේල 105 සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු ප්‍රකාරව Grill ආවරණය වෙනුවෙන් වර්ග මීටර් 140 කට රු. 630,000 ක් වෙන්කර තිබුණද, එම ආවරණ යොදා නොතිබූ අතර, එය සභාවේ ආරක්ෂාවට ගැටළුවක් විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඈ) 2007 අංක 13 හා අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් සංශෝධිත 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 30,065,945 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බදු (CIGFL) වශයෙන් රු. 75,165 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

3.4. මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 02 | 01 | 01 |
| ද්විතික මට්ටම | 17 | 12 | 05 |
| තෘතීය මට්ටම | 20 | 15 | 05 |
| එකතුව | 39 | 28 | 11 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජුනි මස සිට පුරප්පාඩු පවතින ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට විගණිත දින වූ 2015 ජුලි 17 දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) පුස්තකාලයාධිපති, තාක්ෂණික නිලධාරී, විදුලි කාර්මික නිලධාරී, සංවර්ධන නිලධාරී, ආදායම් පරීක්ෂකථ රියදුරු, යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරීක්ෂක තනතුරුවල වර්ෂ 02කේ සිට 05 දක්වා කාලපරිච්ඡේදයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විගණිත දිනය වන විටද කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ
(ආ ආදායම් පරිපාලනය
(ඇ වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) මානව සම්පත් කලමනාකරණය